# ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථාන සඳහා උරුම කළමනාකරණ සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි ශ්‍රී විජයසුන්දරාරාම ටැම්පිට විහාරය ඇසුරෙන්

පී.ඒ.වයි.ආර්. කුලතුංග*

පුරාවිද්‍යා උරුම කළමනාකරණය යනු පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත උරුමයක් නිසියාකාරව සැලසුම් කරමින් හා ආරක්ෂා කරමින් අනාගත පරපුර සඳහා ඉදිරිපත් කිරීම පිණිස විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීම වේ. ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථාන උරුම කළමනාකරණය කිරීම සඳහා කිසිදු වැඩපිළිවෙළක් සිදු වී නොමැති හෙයින් ඒ උරුමයන් විනාශ වෙමින් පවතී. මෙම පර්යේෂණ ක්ෂේත්‍රය වුයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වූ සපුගස්කන්ද ශ්‍රී විජයසුන්දරාරාම ටැම්පිට පුරාණ විහාරය යි. මෙහි අරමුණ වුයේ ශ්‍රී විජයසුන්දරාරාම පුරාණ ටැම්පිට විහාරයෙහි උරුම කළමනාකරණ සැලැස්මක අවශ්‍යතාවය පිළිබඳ විමර්ශනය කිරීම ය. මෙම ටැම්පිට විහාරය මහනුවර සම්ප්‍රදායට හා පහතරට සම්ප්‍රදාය තුළ විදේශීය බලපෑමට ලක්වීම මත නිර්මාණය වූ සිතුවම් සහිත විහාර ද තිබේ. එහෙත් මේ වනවිට මෙම විහාරවල පවතින සිතුවම් බොහෝමයක් හායනයට ලක් වී ඇති අතර ඉතිරි සිතුවම් ද හායනය වෙමින් පවතී. ස්වාභාවික හා මානුෂික ක්‍රියාකාරකම් මත මෙම හායනට හේතු වී ඇත. මීට ප්‍රධාන හේතුව වී ඇත්තේ මිනිසුන් මෙම විහාරවල තිබෙන පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳව අවබෝධයක් නොවීමයි. කළමනාකරණ ක්‍රියාවලියක් නොමැතිවීම නිසා දිනෙන් දින ටැම්පිට විහාර විනාශය කරා යන ආකාරයක් දක්නට ලැබේ. එසේම මෙම විහාරය මෙතෙක් සිදු වී ඇති සංරක්ෂණ විධික්‍රම සාර්ථක වී නොමැත. පිටත බිත්තයේ ඇති සිතුවම්වල රේඛාමය සටහන් පමණක් ශේෂව ඇත. නවීන ගොඩනැගිලි ඉදි කිරීම හරහා ටැම්පිට විහාරයේ පුරාවිද්‍යාත්මක වටිනාකමට බලපෑම් ඇති වී ඇත. ක්ෂේත්‍රය නිරීක්ෂණයෙන්, මුලාශ්‍ර පරිශීලනය, තොරතුරු ලබාගැනීම මෙම පර්යේෂණයේ ක්‍රමවේද වේ. මෙම පර්යේෂණය හරහා අනෙකුත් ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථානවලට උරුමය කළමනාකරණය සැලසුම් අවශ්‍යතාවය පවතින බව මෙහිදී අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද :- උරුම කළමනාකරණය, ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථාන, ටැම්පිට විහාරය, ශ්‍රී විජයසුන්දරාරාමය

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය gayryasantharuwan14@gmail.com